# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2401/21 - 2024 සැප්තැම්බර් මස 11 වැනි බදාදා - 2024.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2024 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.
2. අතිගරු ජනාධිපති; මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024 අගෝස්තු මස 26 දිනැති අංක 24/1706/601/102 දරන සංදේශය සඳහා ලද 2024 අගෝස්තු මස 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ.
3. මෙම රෙගුලාසි, සංශෝධිත, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අනිවාර්ය අංගයක් ලෙස නිකුත් කෙරේ.


1A - PG 6879 — 374 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ඉහත සඳහන් කළ 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 4 දරන රෙගුලාසියෙහි කෙසේ සඳහන් වුව ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) යටතේ ස්ථාපිත කර ක්‍රියාත්මක වන ව්‍යවසායයකට, එම ව්‍යවසාය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ඇතිකරගත් සහ අමාත්‍ය මණ්ඩලය විසින් නිසි ලෙස අනුමත කරන ලද ගිවිසුමේ විධිවිධාන අනුව තම මෝටර් වාහන එකලස් කිරීමේ පහසුකම තුළ එවැනි ව්‍යවසායක් විසින් මෝටර් රථ එකලස් කිරීම සඳහා, 87.02, 87.03 සහ 87.04 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂයන් යටතේ වර්ගීකරණය කර ඇති ලියාපදිංචි නොකළ (නවීන) අර්ධ වශයෙන් කොටස් වලට ගලවන ලද (SKD) කට්ටල ආනයනය සහ රේගු නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත අවසර දිය යුතුය.

එකී ගිවිසුමේ විධිවිධාන ප්‍රකාරව, එන්ජින් සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 3000 ඉක්මවූ ලියාපදිංචි නොකළ (නවීන) අර්ධ වශයෙන් කොටස් වලට ගලවන ලද (SKD) මෝටර් වාහන කට්ටල සඳහා අවසර නොදිය යුතුය.

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

6. ඉහත රෙගුලාසි වලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබා දෙනු ලැබේ.

EOG 09 - 0139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.